<u>මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීමේ සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය සංශෝධන - අංක: 02</u>

<table>
<tr><th>ඡේද අංකය</th><th>දැනට තිබෙන පෙළ</th><th>ඡේද අංකය</th><th>යෝජිත සංශෝධනය</th><th>සංශෝධනයට හේතුව</th></tr>
<tr>
<td>ගිනිහට නිලධාරී තනතුර 05.01</td>
<td>බඳවා ගැනීමේ ක්‍රමය<br>අදාල පළාත් පාලන ආයතනය විසින් ප්‍රසිද්ධ දැන්වීම මගින් අයදුම්පත්‍ර කැඳවා රා.ප.ච.15/90 පරිදි ලිඛිත පරීක්ෂණයක් පවත්වා එහි ප්‍රතිඵල මත තෝරා ගන්නා අය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව බඳවා ගැනීම සිදු කෙරේ.<br><br>බඳවා ගැනීමේ ලිඛිත පරීක්ෂණය:-<br>(අ) සාමාන්‍ය දැනීම හා බුද්ධිය පරීක්ෂා කිරීම සඳහා වන පැය 01 ක ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටිය යුතුය.<br>ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය:-<br>(ආ) ශාරීරික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා අවස්ථාවෝචිත පරිදි යෝග්‍යතා පරීක්ෂණයක් සිදු කෙරේ.<br>ශාරීරික යෝග්‍යතාවය මැන බැලීමේ පරීක්ෂණයේදී අයදුම්කරුට පාලනය කර ගත හැකි හේතු මත සිදු වන යම් තුවාලවීම් හෝ ආපදාවන් සම්බන්ධයෙන් වගකීමට බැඳී නොසිටින අතර ඒ බවට ලිඛිත පොරොන්දුවක් මෙකී පරීක්ෂණයට පෙර ලබා දිය යුතුය.</td>
<td>ගිනිහට නිලධාරී තනතුර 05.01</td>
<td>බඳවා ගැනීමේ ක්‍රමය<br><br>පළාත් පාලන කොමසාරිස් විසින් ප්‍රසිද්ධ දැන්වීම මගින් අයදුම්පත්‍ර කැඳවා රා.ප.ච.15/90 පරිදි ලිඛිත පරීක්ෂණයක් පවත්වා එහි ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූ අයගෙන්,පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර,ශාරීරික යෝග්‍යතා පරීක්ෂනයෙන් සමත් වන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ/ප්‍රායෝගික පරීක්ෂණයට සුදුසුකම් ලබන අතර,සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඉහළම සුදුසුකම් ඇති අයදුම්කරුවන් බඳවා ගැනීම සිදු කෙරේ.<br><br>බඳවා ගැනීමේ ලිඛිත පරීක්ෂණය:-<br>(අ) සාමාන්‍ය දැනීම හා බුද්ධිය පරීක්ෂා කිරීම සඳහා ලකුණු 100 ක් වන පැය 01 ක ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටිය යුතුය. ලකුණු 40 ට වැඩියෙන් ලබා ගන්නා අපේක්ෂකයින් සමත් ලෙස සැලකේ.<br><br>
<table>
<tr><td>සාමාන්‍ය දැනීම</td><td>දේශීය හා විදේශීය වශයෙන් වැදගත් වන කාලීන සිද්ධීන් පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම මැනීම.</td></tr>
<tr><td>බුද්ධිය පරීක්ෂා කිරීම</td><td>අපේක්ෂකයින්ගේ තර්කානුකූල ශක්තිය විශ්ලේෂණය හා සංස්ලේෂණ හැකියාව,ඉක්මනින් හා නිවැරදි තීරණ ගැනීමේ හැකියාව මැනීම</td></tr>
</table>
<br>ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය:-<br>(ආ) ශාරීරික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා පහත කරුණු සලකා බැලේ.
<table>
<tr><th>ඉසව්ව</th><th>හැකියාව මැනීමේ ක්‍රම වේදය</th></tr>
<tr><td>මීටර් 800 ධාවනයේ යෙදීම</td><td>කාලය ගණනය කිරීම</td></tr>
<tr><td>මීටර් 100 ධාවනයේ යෙදීම</td><td>කාලය ගණනය කිරීම</td></tr>
<tr><td>Shuttle Run</td><td>කාලය ගණනය කිරීම</td></tr>
<tr><td>Sit up exercisers</td><td>විනාඩි 02ක කාලය තුළ උපරිමය</td></tr>
<tr><td>dips</td><td>විනාඩි 02ක කාලය තුළ උපරිමය</td></tr>
<tr><td>කඹයක ආධාරයෙන් මීටර් 15 ඉහළට නැගීම සහ බැසීම</td><td>කාලය ගණනය කිරීම(කඹයේ නැගීමේ සහ බැසීමේ තාක්ෂණ ක්‍රම වේදය අනුව)</td></tr>
<tr><td>අඩි 60-100 ප්‍රමාණයේ ඉනිමග නැගීම හා බැසීම</td><td>කාලය ගණනය කිරීම</td></tr>
<tr><td>Drop stick</td><td>ප්‍රතිචාර දැක්වීම</td></tr>
</table>
<br>ශාරීරික යෝග්‍යතාව මැන බැලීමේ පරීක්ෂණයේදී අයදුම්කරුට සිදු වන යම් තුවාලවීම් හෝ ආපදාවන් සම්බන්ධයෙන් වගකීමට බැඳී නොසිටින අතර ඒ බවට ලිඛිත පොරොන්දුවක් මෙකී පරීක්ෂණයට පෙර ලබා දිය යුතුය.</td>
<td>පත්වීම් බලධාරියා පළාත් පාලන කොමසාරිස් වන අතර බඳවා ගැනීමට අදාල අයදුම්පත්‍ර කැඳවීම ඇතුළු අනෙකුත් කාර්යයන් පත්වීම් බලධාරියා විසින් සිදු කළ යුතු වීම.<br><br>ලිඛිත පරීක්ෂණයේ විෂය නිර්දේශයන් ඇතුලත් කිරීම<br><br>ශාරීරික යෝග්‍යතාවය පරීක්ෂා කිරීමට අදාල කරුණු ඇතුලත් කිරීම.</td>
</tr>
<tr>
<td>ගිනිහට නිලධාරී තනතුර 06.</td>
<td>පුහුණු කාලසීමාව තුලදී රු 5000/- මාසික දීමනාවක් ගෙවනු ලැබේ.</td>
<td>ගිනි හට නිලධාරී තනතුර 06.</td>
<td>පුහුණු කාලසීමාව තුලදී රු 15000/- මාසික දීමනාවක් ගෙවනු ලැබේ.</td>
<td>රු 5000/- මාසික දීමනාව කාලෝචිතව සංශෝධනය කිරීම</td>
</tr>
<tr>
<td>ගිනිහට නිලධාරී තනතුර 06.</td>
<td>පුහුණුව සඳහා ඇතුලත් වන අවස්ථාවේදී අභ්‍යාසලාභීන් විසින් පුහුණුව සාර්ථකව නිම කිරීමෙන් අනතුරුව වර්ෂ 05ක කාලසීමාවක් මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ සේවය කරන බවට රු.10000/- වටිනාමකින් යුතු බැදුම්කරයක් අත්සන් කල යුතුය.</td>
<td>ගිනි හට නිලධාරී තනතුර 06.</td>
<td>පුහුණුව සඳහා ඇතුලත් වන අවස්ථාවේදී අභ්‍යාසලාභීන් විසින් පුහුණුව සාර්ථකව නිම කිරීමෙන් අනතුරුව වර්ෂ 05ක කාලසීමාවක් මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ සේවය කරන බවට රු.100,000/- වටිනාමකින් යුතු බැදුම්කරයක් අත්සන් කල යුතුය.</td>
<td>බැදුම්කරයේ වටිනාම කාලෝචිතව සංශෝධනය කිරීම</td>
</tr>
</table>

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2017.06.26 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය :- නිර්දේශ කරමු

| නම | | අත්සන |
|---|---|---|
| 01. ගාමිණී දසනායක මහතා | (සභාපති) | ......(signed)...... |
| 02. යූ.ඒ. බෝගහපිටිය මහතා | (සාමාජික) | ......(signed)...... |
| 03. පී.පී.එස්.ඒ. දිසානායක මිය | (සාමාජික) | ......(signed)...... |
| 04. වී.නන්දකුමාර් මහතා | (සාමාජික) | ......(signed)...... |
| 05. ඒ.ජේ.එම්.එම්. නිස්තාර් මහතා | (සාමාජික) | A.J.M.M. Nisthar |

දිනය 2017.04.25

ආණ්ඩුකාර ලේකම්,

2017.04.25 දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 171626 යටතේ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීමේ සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය සංශෝධනයට ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය 2017.05.19

..............(signed)..............

ඇ.ඊ. එම්. එන්. රත්නායක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

ලේකම්

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

නිල මුද්‍රාව

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය :-

**අනුමත කරමි / ~~නොකරමි~~**

..............(signed)..............

නිලූකා ඒකනායක
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර
2017.06.06.